කාර්ය සාධන වාර්තාව

# பெறுபேற்று அறிக்கை

# PERFORMANCE REPORT

# 2013

## ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

## தேசிய பௌதீக திட்டமிடல் திணைக்களம்

## DEPARTMENT OF NATIONAL PHYSICAL PLANNING

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

**மாநகர சபை மற்றும் மேல்மாகாண அபிவிருத்தி அமைச்சு**

**MINISTRY OF MEGAPOLIS & WESTERN DEVELOPMENT**

# කාර්ය සාධන වාර්තාව

# 2013

## ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව

මහානගර හා බස්නාහිර සංවර්ධන **අමාත්‍යාංශය**

# අන්තර්ගතය


- අන්තර්ගතය 01
- හැඳින්වීම 02
- මෙහෙවර 04

01.*ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව - අනුමත කාර්ය මණ්ඩලය* ***05***

02.පාලන අංශයේ කාර්යසාධනය 07

03.කලාපීය භෞතික සැලසුම් අංශයේ කාර්යසාධනය 09

04.ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශයේ කාර්යසාධනය 13

05.ඉංජිනේරු අංශයේ කාර්යසාධනය 15

06.වාස්තු විද්‍යා අංශයේ කාර්යසාධනය 20

07.ගිණුම් අංශයේ කාර්යසාධනය 24

## හැඳින්වීම

බ්‍රිතාන්‍ය පාලන සමයේදී අගනුවර වූ කොළඹ පිහිටි ජනාවාස ආශ්‍රිතව ඉදිකිරීම් සම්බන්ධයෙන් පැන නැගුණු ගැටළු නිරාකරණය අරමුණු කරගෙන 1915 අංක 19 දරණ නිවාස හා නගර වැඩි දියුණු කිරීමේ ආඥා පනත බලාත්මක විය.නමුත් වරාය හා දුම්රිය ආශ්‍රයෙන් ඇතිවූ නගර වල සංවර්ධනය සම්බන්ධයෙන් උක්ත පනතින් ආවරණය නොවූ ගැටළු ඇතිවිය.ඊට පිළියමක් ලෙස ,1946 අංක 13 දරණ නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත යටතේ 1947 වර්ෂයේදී නගර හා ග්‍රාම නිර්මාණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී.මේ යටතේ දිවයිනේ සියළු පළාත් ආයතන සම්බන්ධ කර ගනිමින් ජනාවාස සංවර්ධනය සඳහා සැලසුම් යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම ආරම්භ විය.

නිසි සැලැස්මක් හා ඉදිරි දැක්මක් නොමැතිව රට තුල ඇතිවූ සීඝ්‍ර සංවර්ධන ක්‍රියාවලියෙහි ප්‍රතිඵලයක් ලෙස දුගී භාවය සම්පත් බෙදී යාමේ විෂමතාවය නිසා ප්‍රත්‍යන්ත ප්‍රදේශයන්හි සංවර්ධනයක් සිදු නොවීම ,පරිපාලනය කොළඹ හා ප්‍රධාන නගර කීපයකට කේන්ද්‍රගතවීම, ජීවත්වීමට අවශ්‍ය මූලික පහසුකම් නොමැතිව විරැකියාවෙන් පෙළෙන සහනාධාර මතම ජීවත්වන බහුතර ජනතාවක් ව්‍යාප්ත වීම ආදී ගැටළු රාශියක් පැන නැගිනි. එබැවින් ආංශික සංවර්ධනයත් ප්‍රාදේශීය සංවර්ධනයත් අත්වැල් බැදගත් තිරසාර සංවර්ධන ක්‍රියාවලියක අවශ්‍යතාවය දැඩි ලෙස දැනුනි.

ඊට පිළියමක් ලෙස ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තියක් පදනම් කොටගත් ජාතික භෞතික සැලැස්මක් සකස් කරනු ලැබීම පිණිස 2000 අංක 49 දරණ නගර හා ග්‍රාම නිර්මාණ සංශෝධිත පනතින්, 1946 අංක 13 දරන නගර හා ග්‍රාම නිර්මාණ ආඥා පනත සංශෝධනය කර, 2000 වර්ෂයේදී ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී.

ඒ අනුව ජාතික භෞතික සැලැස්ම , කලාපීය භෞතික සැලසුම් සහ ප්‍රාදේශීය භෞතික සැලසුම් සැකසීම , ක්‍රියාත්මක කිරීම හා යාවත්කාලීන කිරීමත්, පූජා භූමි සංවර්ධනය උදෙසා ව්‍යාපෘති සැලසුම් කිරීම හා වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරුමය සැලසුම් සමග ඒ සඳහා වින්‍යාස සැලසුම් සැකසීමත් අතින් ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවට වසර හැත්තෑවකට ආසන්න සේවා ඉතිහාසයක් ඇත.

ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක විසි පහ ආවරණය කරමින් පළාත් නවයෙහිම පළාත් පාලන ආයතනවල සහයෝගය ඇතිව සීමිත ස්වභාවික සම්පත් සූක්ෂම ලෙස භාවිත කරමින්ද, ස්වාභාවික පරිසරය රැක ගනිමින්ද ස්වාභාවික විපත් අවම වන සුදුසු ස්ථානයන්හි අපරව්‍යුහ පහසුකම් වලින් යුතු නගර ස්ථාපිත කිරීම සඳහා නගර සැලසුම් කිරීම, ශ්‍රී ලංකාවට යෝග්‍ය නව නාගරික නිර්ණායකයන් හඳුනා ගැනීම, ආර්ථික සංවර්ධන අවස්ථාවන් උපායශීලි ලෙස උපයෝගී කර ගනිමින් ලංකාවට ගැලපෙන කර්මාන්ත

උද්‍යාන ආකෘතියක් හඳුනා ගැනීම මගින් තිරසාර සංවර්ධනයට දායක වීම ආදී කර්තව්‍යන් ඉටු කරමින් ශ්‍රී ලංකාවේ සැලසුම්කරණයේ යෙදී සිටින ප්‍රධානතම රාජ්‍ය ආයතනය ලෙස ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ නගර සංවර්ධනයට ඉටු කල සහ ඉටුකරමින් සිටින මෙහෙවර අති මහත්‍ය.

මෙම කර්තව්‍යන් ඉටු වන්නේ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ වන ජාතික භෞතික සැලසුම් අංශය, ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශය, කලාපීය භෞතික සැලසුම් අංශය,පර්යේෂණ අංශය හා එම මෙහෙය සඳහා දායකත්වය සපයන පාලන අංශය, ගිණුම් අංශය,ඉංජිනේරු අංශය, වාස්තු විද්‍යා අංශය යන අංශවල සාමුහික කැපවීමෙනි. මෙම එක් එක් අංශවල 2013 වසරේ කාර්ය සාධනය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු එක් එක් පරිච්ඡේද යටතේ දක්වා ඇත.

**මෙහෙවර**

" ජාතික භෞතික ප්‍රතිපත්ති ,සැලසුම් සහ උපාය මාර්ග සකස් කිරීම සහ ශ්‍රී ලංකාවේ සහ මුහුදු සීමාවට අයත් ප්‍රදේශයන්හි ආර්ථික,සමාජයීය,භෞතික සහ පාරිසරික අංශයන්හි ඒකාබද්ධ සැලැස්මක් ක්‍රමවත්ව ඇති කිරීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ අරමුණු ඇතිව,පළාත් බද හා ප්‍රාදේශීය සැලසුම් මගින් එම ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාවට නංවීම තහවුරු කිරීම සහ පාලනය කිරීම"

## *1. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව - අනුමත කාර්ය මණ්ඩලය*

| අනු අංකය | තනතුර | සේවය | ශ්‍රේණිය | වැටුප් කාණ්ඩය | අනුමත තනතුරු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 1. | අධ්‍යක්ෂ ජනරාල් | | විශේෂ | SL 3-2006 | 1 |
| 2. | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) | දෙපාර්තමේන්තුගත | විශේෂ | SL 3-2006 | 1 |
| 3. | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ක්‍රියාත්මක කිරීම්) | දෙපාර්තමේන්තුගත | විශේෂ | SL 3-2006 | 1 |
| 4. | අධ්‍යක්ෂ (පාලන) | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 1 | SL 1-2006 | 1 |
| 5. | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 1 | SL 1-2006 | 1 |
| 6. | අධ්‍යක්ෂ (ඉංජිනේරු) | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 1 | SL 1-2006 | 1 |
| 7. | අධ්‍යක්ෂ (ක්‍රියාත්මක කිරීම්, ඇගයීම් හා සම්බන්ධීකරණ) | දෙපාර්තමේන්තුගත | 1 | SL 1-2006 | 1 |
| 8 | අධ්‍යක්ෂ (පර්යේෂණ) | දෙපාර්තමේන්තුගත | 1 | SL 1-2006 | 1 |
| 9 | අධ්‍යක්ෂ (කලාපීය භෞතික සැලසුම්) | දෙපාර්තමේන්තුගත | 1 | SL 1-2006 | 1 |
| 10 | අධ්‍යක්ෂ (ප්‍රාදේශීය භෞතික සැලසුම්) | දෙපාර්තමේන්තුගත | 1 | SL 1-2006 | 1 |
| 11 | අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය | 1 | SL 1-2006 | 1 |
| 12. | නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (පාලන) | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 111/11 | SL 1-2006 | 1 |
| 13. | අභ්‍යන්තර විගණක | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 11 | SL 1-2006 | 1 |
| 14 | ගණකාධිකාරී | ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය | 111/11 | SL 1-2006 | 1 |
| 15. | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (ඉංජිනේරු) | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 111/11 | SL 1-2006 | 03 |
| 16. | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ (නගර නිර්මාණ ) | දෙපාර්තමේන්තුගත | 111/11 | SL 1-2006 | 20 |
| 17. | සහකාර අධ්‍යක්ෂ/නියෝජ්‍ය අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා වාස්තු විද්‍යාඥ සේවය | 111/11 | SL 1-2006 | 2 |
| 18. | නීති නිලධාරී | දෙපාර්තමේන්තුගත | | SL 1-2006 | 1 |
| 19. | පරිපාලන නිලධාරී | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය (අධි පන්තිය) | අධි ශ්‍රේණිය | MN 7-2006 A | 1 |
| 20 | සැලසුම් කාර්යාල සහකාර | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය (විශේෂ පන්තිය) | | MN 7-2006 A | 03 |
| 21. | ප්‍රධාන පරීක්ෂක | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය (විශේෂ පන්තිය) | විශේෂ | MN 7-2006 A | 2 |
| 22. | භූගෝලීය තොරතුරු පද්ධති තාක්ෂණික ශිල්පී | ශ්‍රී ලංකා සංනිවේදන හා තොරතුරු තාක්ෂණ සේවය | විශේෂ | MN 6-2006 A | 6 |
| 23. | පද්ධති පරිපාලක | දෙපාර්තමේන්තුගත | | MN 6-2006 A | 1 |
| 24. | සංවර්ධන සහකාර | ආශ්‍රිත සේවා පුරප්පාඩු නොපිරවීම තුළින් තනතුරු අවසන් කිරීමට යටත්ව | 2-11/1 | MN 4-2006 A | 22 |
| 25. | භෞතික සැලසුම් සහකාර (නගර නිර්මාණ) | ආශ්‍රිත සේවා දෙපාර්තමේන්තුගත | | MN 4-2006 A | 20 |
| 26. | භෞතික සැලසුම් සහකාර (වාස්තු විද්‍යාඥ) | ආශ්‍රිත සේවා දෙපාර්තමේන්තුගත | | MN 4-2006 A | 05 |
| 27. | භෞතික සැලසුම් සහකාර (ඉංජිනේරු) | දෙපාර්තමේන්තුගත (පුරප්පාඩු නොපිරවීම තුළින් තනතුරු අවසන් කිරීමට යටත්ව) | | MN 4-2006 A | 04 |
| 28 | අයවැය සහකාර | ආශ්‍රිත සේවා | | MN 4-2006 A | 01 |
| 29. | සැලසුම් ශිල්පී | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | 111/11/1 | MN 3-2006 A | 27 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 30. | පරීක්ෂක | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | 111/11/1 | MN 3-2006 A | 9 |
| 31. | රාජ්‍ය කළමනාකරණ සහකාර | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 111/11/1 | MN 2-2006 A | 34 |
| 32. | පිළිගැනීමේ නිලධාරි | දෙපාර්තමේන්තුගත (දැනට තනතුර දරන නිලධාරියාට පෞද්ගලික වනසේ) | 111/11/1 | PL 1/2006 A | 1 |
| 33. | සැලසුම් මුද්‍රණකරු | දෙපාර්තමේන්තුගත | 111/11/1 විශේෂ | PL 1-2006 A | 2 |
| 34. | මානක කම්කරු | දෙපාර්තමේන්තුගත | 111/11/1 විශේෂ | PL 1-2006 A | 3 |
| 35. | සැලසුම් භාරකරු | දෙපාර්තමේන්තුගත | 111/11/1 විශේෂ | PL 1-2006 A | 1 |
| 36. | සැලසුම් අළුත්වැඩියාකරු | දෙපාර්තමේන්තුගත | 111/11/1 | PL 1-2006 A | 1 |
| 37 | රියදුරු | රියදුරු සේවය | 111/11/1 විශේෂ | PL 3-2006 A | 14 |
| 38. | කාර්යාල කාර්ය සහායක | කාර්යාල සේවක සේවය | 111/11/1 විශේෂ | PL 1-2006 A | 17 |
| 37. | බංගලා භාරකරු | දෙපාර්තමේන්තුගත | 111/11/1 විශේෂ | PL 1-2006 A | 4 |
| 38. | මුරකරු | දෙපාර්තමේන්තුගත | 111/11/1 විශේෂ | PL 1-2006 A | 4 |

## 02.පාලන අංශයේ කාර්යසාධනය

දෙපාර්තමේන්තුවේ මෙහෙවර තුළින් ළඟා කර ගැනීමට අපේක්ෂිත අරමුණු කාර්යක්ෂමවත්, ඵලදායීවත් සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය සහාය සේවාවන් සැපයීම පාලන අංශයේ ප්‍රධාන කාර්යභාරයයි.

එහි දී මානව හා භෞතික සම්පත් කළමනාකරණ කටයුතු, ආයතනික හා පරිපාලනමය කටයුතු සිදු කිරීමත්, ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාත්මක කිරීමත්, දෙපාර්තමේන්තුවේ සියලු අංශයන් සඳහා සහාය සේවාවන් සැපයීමත්, පූජා භූමි කාර්ය මණ්ඩලයේ පාලනය පවත්වාගෙන යාමත් පාලන අංශයෙන් සිදු කරයි.

### 2.1 පාලන අංශයේ ප්‍රධාන අරමුණු වනුයේ,

- දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය දෙපාර්තමේන්තුවේ අරමුණු ලඟාකර ගත හැකි වන පරිදි සංශෝධනය කිරීම.
- බඳවා ගැනීමේ පරිපාටි, උසස් කිරීමේ පරිපාටි සැකසීම, අනුමත කරවා ගැනීම හා ක්‍රියාත්මක කිරීම.
- කාර්ය මණ්ඩලයේ කුසලතා වර්ධනය, සුභසාධනය, විනය පවත්වා ගැනීම, ආදියයි.

### 2.2 දෛනික රාජකාරි ලෙස,

- දෛනික තැපැල පිළිබඳ කටයුතු කිරීමත්
- අංශවල හා අංශ ගත සංබන්ධීකරණය පවත්වාගෙන යාමත්.
- මහජන ඉල්ලීම් සඳහා අවශ්‍ය කටයුතු කිරීමත්.
- සේවක මණ්ඩල ඉල්ලීම් පිළිබඳ කටයුතු කිරීමත්.
- කාර්ය මණ්ඩල පෞද්ගලික ලිපිගොනු නඩත්තුව, පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීමත්.
- ප්‍රවාහන ඒකකය කළමනාකරණය කිරීමත්.
- සේවක වැටුප්, දීමනා, ගමන් වියදම් හා සියලුම ගෙවීම් සම්බන්ධ බිල්පත් ගෙවීම් කිරීමට අදාළ කටයුතුත් ය.

එසේම

- පාර්ලිමේන්තු ප්‍රශ්නවලට, මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිලිවලට, මහජන පෙත්සම් කාරක සභාවේ ප්‍රශ්නවලට පිළිතුරු ලබාදීම, විගණන විමසුම් සඳහා පිළිතුරු සැකසීම හා සම්බන්ධීකරණය.

- ❖ නිලධාරීන්ගේ කාර්යසාධනය ඇගයීම.
- ❖ කාර්යක්ෂමතා කඩඉම් විභාග පැවැත්වීම.
- ❖ දෙපාර්තමේන්තුවේ ආරක්ෂාව පිළිබඳව කටයුතු කිරීම.
- ❖ නඩත්තු කටයුතු පිළිබඳව කටයුතු කිරීම.
- ❖ කැබිනට් මණ්ඩල පත්‍රිකා සැකසීම.
- ❖ පූජා භූමි කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම, පාලන අංශයට පැවරුණු වෙනත් විශේෂ රාජකාරි වේ.


## 03. කලාපීය භෞතික සැලසුම් අංශයේ කාර්ය සාධනය

මෙම ආයතනයේ ප්‍රධානතම කාර්යය වන ජාතික භෞතික සැලැස්ම, ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සකස් කිරීම සහ කළාපීය භෞතික සැලසුම් සකස් කිරීම මෙම අංශයට අයත් කාර්යභාරය වේ.

### 3.1 ජාතික භෞතික සැලැස්ම සහ ප්‍රතිපත්තිය සකස් කිරීමේ අරමුණ

රට තුළ හා ඉන් බාහිරව ඇති භෞතික සම්පත් නිසිලෙස ප්‍රයෝජනයට ගෙන ජාත්‍යන්තර වශයෙන් ඇතිවී ඇති ආර්ථික සංවර්ධන අවස්ථාවන් උපායශීලි ලෙස උපයෝගි කර ගැනීමත් භෞතික සංවර්ධන ක්‍රියාවලිය ජාතික හා ජාත්‍යන්තර ලෙස සම්බන්ධීකරණය කිරීමත් පවතින සමාජ ආර්ථික හා භෞතික විෂමතා අවම කර ගැනීමටත්, ස්වභාවික පරිසර ජාලය සහ පාරිසරික අධි සංවේදී ප්‍රදේශ රැක ගනිමින්ද , වර්ධනය කර ගනිමින්ද ස්වභාවික විපත් අවම වන අන්දමට සුදුසු ස්ථානයන්හි ජනාවාස නගර හා අපර ව්‍යුහ පහසුකම් හා වනාන්තර ඇතුළත් පාරිසරික පද්ධතියක් ස්ථාපිත කිරීමටත් ජාතික ආර්ථිකයේ ප්‍රතිලාභ දෙගුණ තෙගුණ කිරීමටත් ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය සහ සැලැස්ම වැදගත් වේ.

### 3.2 ජාතික භෞතික සැලසුම සකස් කිරීමේ ක්‍රියාවලිය




රූප සටහන 02: ජාතික භෞතික සැලසුම සකස් කිරීමේ ක්‍රියාවලිය

මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර

### 3.3 2012 වසරේ දී කරන ලද කාර්යයන්

3.3.1 ජාතික භෞතික සැලැස්ම තුලින් හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

- ජාතික භෞතික සැලැස්ම තුලින් හඳුනාගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඉඩම් හඳුනාගැනීම හා මූලික ශක්‍යතා අධ්‍යයන කටයුතු කිරීම.

3.3.2 ජාතික භෞතික සැලසුම් ප්‍රතිපත්තිය ඕනෑම ආයතනයකට තමන්ගේ භෞතික සැලසුම්කරණයේදී භාවිතා කරගත හැකිවන අයුරින් සකස් කිරීම.

- අදාල ආයතන හඳුනාගැනීම හා අමාත්‍යාංශ මට්ටමින් කමිටුවක් පත් කිරීම.

3.3.3 ජාතික භෞතික සැලැස්ම ක්‍රියාත්මක මට්ටමකට ගෙන ඒම


- අදාල ආයතන හඳුනාගැනීම.

### 3.4 කලාපීය සැලසුම් සකස් කිරීම.

රටට වඩා කුඩා වූද, නගරයකට වඩා විශාල වූද ප්‍රදේශයක් සඳහා සැලසුම් සකස් කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ. අපගේ අවශ්‍යතාවය සඳහා ඇමතිතුමා විසින් ශ්‍රී ලංකාවේ පළාත්, කලාප වශයෙන් හඳුන්වා ගැසට් මගින් ප්‍රකාශයට පත් කර ඇත.

### 3.5 කලාපීය සැලැස්ම සකස් කිරීම

- කලාපීය සැලැස්ම සකස් කරන්නේ කලාපීය සැලසුම් කමිටුව විසින්ය.
- මෙම කමිටුවේ සභාපති වන්නේ පළාත් සභාවේ ප්‍රධාන ලේකම්ය.
- පළාතේ සියළුම නගර සභා /ප්‍රාදේශීය සභාවල සභාපතිවරුන්ද මහ නගර සභාවල නාගරික කොමසාරිස්වරුන්ද මෙම කමිටුවේ සාමාජිකයෝ වෙති.
- සමහර රජයේ ආයතනවල නිලධාරීන්ද මෙම කමිටුවට ඇතුලත් වෙති.




රූප සටහන 03 : කලාපීය සැලසුම් කමිටුව

ජාතික භෞතික සැලසුම්දෙපාර්තමේන්තුව විශේෂයෙන් ස්ථාපිත කර ඇත්තේ කලාපීය සැලසුම් සකස් කිරීම පිණිස පළාත් සභා වලට සහය වීමටයි. ඒ සඳහා පහත දැක්වෙන අයුරින් එම දෙපාර්තමේන්තුව පළාත් සභා වලට සහාය වේ.

- ❖ තාක්ෂණික උපදෙස් ලබාදීම
- ❖ අවශ්‍ය ඕනෑම කරුණක් පිළිබඳව කලාපීය සැලසුම් කමිටුවට අවශ්‍ය විශේෂඥයින්ගේ සේවය ලබා දීම.
- ❖ රැස්වීම් , ඉදිරිපත් කිරීම් හා මහජන අදහස් ලබා ගැනීම පිනිස සහය වීම.
- ❖ අවශ්‍ය තොරතුරු හා සැලසුම් ඕනෑම ආයතනයකින් ලබා ගැනීමට සහය වීම.
- ❖ සැලසුම්, වාර්තා ඉදිරිපත් කිරීම් සඳහා අවශ්‍ය සහය ලබාදීම.
- ❖ සැලැස්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මුදල් වල හිඟයක් වෙතොත් ඒවා ලබා ගැනීමට සහය වීම.

### 3.6 2013 වසරේ දී කරන ලද කාර්යයන්

3.6.1 උතුරු පළාත් කළාපීය භෞතික සැලැස්ම සකස් කිරීම.

- ○ සැලසුම් සඳහා සංශෝධන එකතු කිරීම.
- ○ කළාපීය සැලසුම් කමිටුව පත් කිරීම.

3.6.2 මධ්‍යම පළාත් පාරිසරක අධිසංවේදී ප්‍රදේශ සැලසුම සකස් කිරීම.

- ○ මූලික දත්ත රැස් කිරීම.
- ○ දළ සැලසුම සකස් කිරීම.

3.6.3 වෙරළාශ්‍රිත අධිසංවේදී කළාපය සඳහා සවිස්තරාත්මක සැලසුම් සකස් කිරීම.

- ○ මූලික වශයෙන් ආපදාවලට ලක්විය හැකි පෙදෙස් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් හඳුනා ගැනීම.

3.6.4 උතුරු මැද පලාත් කලාපීය භෞතික සැලසුම සකස් කිරීම

- ○ කලාපීය සැලසුම් කමිටුව පත් කිරීම.

3.6.5 සබරගමු පළාත් කලාපීය භෞතික සැලසුම සකස් කිරීම.

3.6.6 ඌව පළාත් කළාපීය භෞතික සැලසුම සකස් කිරීම

- ○ ගරු ඇමතිතුමාගේ අවසන් අනුමැතියට යැවීඹට පෙර ප්‍රධාන ලේකම්තුමාගේ අදහස් ලබා ගැනීම.

# 4. ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශය

ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශය මගින් සිදුකරනුයේ කලාපීය භෞතික සැලසුම් මගින් හඳුනාගන්නා ලද ප්‍රාදේශීය වශයෙන් වැදගත් නගර සැලසුම් ක්‍රියාත්මක කිරීම සහ පූජා භූමි සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය තාක්ෂණික සහය ලබා දීමත් ,පූජා භූමි ගැසට් කිරීම මගින් ප්‍රකාශයට පත් කිරීමත්ය.

## 4.1 ප්‍රාදේශීය භෞතික සැලසුම් අංශයේ කාර්යභාරය

- කුඩා නගර සංවර්ධන සැලසුම් සැකසීම.
- පුරනැගුමවැනිව්‍යාපෘතිභරභාර්වාක්‍රියාත්මකකරවීම.
- ආපදාවන්ට ලක්වූ ප්‍රදේශ සඳහා ජනාවාස සැලසුම් සැකසීම.
- ඊට අමතරව හඳුනාගත් පූජා භූමි ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීම.
- සංවර්ධන සැලසුම් සැකසීම.
- අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා විවිධ ආයතන විසින් කරනු ලබන විවිධ ඉඩම් භාවිතයන් සඳහා වන නිරීක්ෂණ ලබාදීම.
- අමාත්‍යාංශය මගින් විවිධ අවස්ථාවලදී අප වෙත පවරන ලද විශේෂ ව්‍යාපෘති ක්‍රියාවට නංවීම
- ප්‍රාදේශීය ලේකම් කාර්යාල හා විවිධ ආයතන විසින් කරනු ලබන විවිධ ඉඩම් භාවිතයන් සඳහා වන නිරීක්ෂන ලබාදීම සහ අමාත්‍යාංශය මගින් විවිධ අවස්ථාවලදී අප වෙත පවරන ලද විශේෂ ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම ආදිය සිදු කරයි.

## 4.2 2013 වසරේ දී කරන ලද කාර්යයන්

4.2.1 පුර නැඟුම සංවර්ධන ව්‍යාපෘතිය

- ○ තෝරාගන්නා ලද කුඩා නගර 54 ක් සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීම යෝජිත ව්‍යාපෘති සඳහා සැලසුම් සකස් කිරීම.

4.2.2 ලෝලුගස්වැව නගර සංවර්ධන ව්‍යාපෘතිය

- ○ අදාල සැලසුම් හා ඇස්තමේන්තු සකස් කිරීම.

4.2.3. මහමෙව්නාව උයන සංවර්ධන ව්‍යාපෘතිය

- ○ ආලෝකකරණ පද්ධතිය වැඩි දියුණු කිරීම.
- ○ භූ දර්ශන කටයුතු කිරීම.

4.2.4 දැයට කිරුළ ජාතික සංවර්ධන හා අධ්‍යාපන ප්‍රදර්ශනය 2014 (කුලියාපිටිය)

○ ව්‍යූහ සැලසුම් සකස් කිරීම.

○ අදාල ආයතන සමඟ සම්බන්ධීකරණය

4.2.5 කඩුවෙල හා ඒ අවට ප්‍රදේශය සංවර්ධන සැලැස්ම සකස් කිරීම.

○ සැලසුම සකස් කිරීම.

4.2.6 විශ්ව විද්‍යාල නගර සංවර්ධන වැඩසටහන

○ ව්‍යාපෘතියට අදාලව දෙපාර්තමේන්තුව විසින් ඉටුකල යුතු කාර්‍ය්‍ය භාරය හඳුනා ගැනීම.

○ මූලික ක්ෂේත්‍ර පරීක්ෂණ කටයුතු සිදුකිරීම.

4.2.7 පූජා නගර වැඩසටහන.

○ එක් එක් පූජා නගරය සඳහා වැඩසටහනක් සකස් කිරීම.

## 5.ඉංජිනේරු අංශයේ කාර්යසාධනය

### 5.1 කාර්යභාරය -

ජාතික සැලසුම , කලාපීය සැලසුම , ප්‍රාදේශීය සැලසුම් , කුඩා නගර , ප්‍රජා නගර,ගොඩනැගිලි ,භූ දර්ශන සැලසුම ආදිය සැලසුම් කිරීමේදී හා ක්‍රියාවට නංවීමේදී අවශ්‍ය වන සිවිල් ඉංජිනේරුමය සේවාව කාර්යක්ෂමව ඉටුකර දීම.

### 5.2 කාර්ය මණ්ඩලය -

අධ්‍යක්ෂ ඉංජිනේරු සෘජු අධීක්ෂණය යටතේ ඉංජිනේරු ,පරීක්ෂක ,ප්‍රමාණ සමීක්ෂණ අංශය යන අංශ තුන සේවය සපයයි.මෙම අංශයෙහි අධ්‍යක්ෂ ඉංජිනේරු යටතේ සහකාර අධ්‍යක්ෂ ඉංජිනේරු දෙදෙනෙකු , පරීක්ෂකවරු දෙදෙනෙකු , ප්‍රමාණ සමීක්ෂණ දෙදෙනෙකු ,සංවර්ධන නිලධාරියකු , මැනුම් සහයකයන් දෙදෙනෙකු හා කාර්යාල කාර්ය සහයක දෙදෙනෙකු සේවයෙහි යෙදී සිටී.

### 5.3 දෛනික රාජකාරි

- ගොඩනැගිලි සඳහා ව්‍යුහ නිර්මිත සැලසුම් සකස් කිරිම.
- ඉදිකිරීම් කටයුතු සඳහා උපදේශනය.
- ඇස්තමේන්තු සකස් කිරිම
- ගෙවීම් වාර්ථා හා වච්චර්පත් සැකසීම.
- ඉඩම් සමීක්ෂන සංවර්ධන කටයුතු සඳහා පළාත් පාලන ආයතන වෙත රජයේ ඉඩම් අත්පත් කර ගැනීම පැවරීම ආදී කටයුතු සඳහා.
- නගර සැලසුම් සඳහා ඉඩම් පරිහරණ සමීක්ෂණය හා වාර්ථා සැකසීම.
- සංවර්ධන සැලසුම් සකස් කිරීමේදී අදාල වන ලෙසට සංවර්ධන සැලසුම් සකස් හා ඉදිකිරීම් කාර්යන් සඳහා ක්ෂේත්‍ර පරීක්ෂණ ,ඉඩම් මැනීම,සිතියම් සකස් කිරීම,සමෝච්ච රේඛා සැලසුම් සකස් කිරීම , නගර සැලසුම් ගෙඩනැගිලි සැලසුම් ආදිය භූමියෙහි පිහිටුවීම.
- ඉදිකිරීම් හා භූ දර්ශන කටයුතුවලදී හා නඩත්තු කටයුතු වලදී වැඩබිම් පරිපාලනය
- ඉදිකිරීම් හා භූ දර්ශන කටයුතුවලදී වැඩ අධීක්ෂනය ,බිල්පත් සැකසීම ,බිල්පත් සහතිකය , රැඳවුම් මුදල් නිදහස් කිරීමේ වාර්තා, ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම.
- දෙපාර්තමේන්තුව සතු ගොඩනැගිලි නඩත්තුව සඳහා ඇස්තමේන්තු සකස් කිරීම හා නඩත්තු කටයුතු ඉටු කිරීම

## 5.4 2013 වසරේදී ඉංජිනේරු අංශයෙන් කරන ලද කාර්යයන්

| අනු අංකය | ව්‍යාපෘතිය | කරන ලද කාර්යය |
|---|---|---|
| 1 | පොතුවිල් - මුහුදු මහා විහාරය | සංඝාවාසය හා පුස්තකාලය සඳහා නව ගොඩනැගිල ඉදිකිරීමට යෝජිත ස්ථානයේ භූමිය පරීක්ෂා කිරීම සහ ව්‍යුහ නිර්මිත සැලසුම් පිළියෙල කිරීම |
| 2 | මාදිවෙල | i. රියම්පෝරුව ගංගාතිලක පුරාණ රජමහා විහාරය ඉදිකාරීම් කටයුතු සඳහා අවශ්‍ය මිණුම් කටයුතු හා Roof design<br>Ii. රන්වැට සහිත බෝධි ප්‍රාකාරය ඉදි කිරීම.<br>Iii.වහලය සඳහා පැති උළු වැසීම (විහාර ගෙය) |
| 3 | අස්ගිරිය | අස්ගිරිය රජමහ විහාරය යෝජිත කාර්යාල ගොඩනැගිල්ල සඳහා භූමිය පරීක්ෂා කිරීම සහ ආරක්ෂක ගොඩනැගිල්ල සඳහා ව්‍යුහ නිර්මිත සැළසුම් පිළියෙල කිරීම |
| 4 | මාතර හක්මන - කැබිලිතිපොල රජමහ විහාරය සංවර්ධනය | 1. යෝජිත ධාතු මන්දිරය සහ ධර්ම ශාලාව ඉදිකිරීම් කටයුතු සඳහා මැණුම් කටයුතු හා ව්‍යුහ නිර්මිත සැලසුම් කිරිම<br>2. ඉදිකිරීම් කටයුතු පරීක්ෂා කිරීම හා ව්‍යුහ නිර්මිත සැළසුම් කිරීම (කාර්යාල ගොඩනැගිල්ල සීමාමාලකය සහ පොකුණක් ඉදි කිරීම) |
| 5 | තිස්සමහාරාම | පූජා භූමි සංවර්ධන ව්‍යාපෘතිය ක්ෂේත්‍ර පරීක්ෂාව<br>යෝජිත සංඝාවාසය සඳහා භූමිය පරීක්ෂා කිරීම සහ ව්‍යුහ නිර්මිතයන් සඳහා සැලසුම් සකස් කිරීම |
| 7 | පොලොන්නරුව | පුලතිසි නිකේතනය<br>1. විදුලි පද්ධතිය අළුත්වැඩියා කරවීම.<br>2. මුළු තැන්ගෙයට කල යුතු අළුත්වැඩියාවන් පිළිබඳ පරීක්ෂා කිරීම. |
| 8 | කතරගම | සංචාරක නිවාසය වායු සමීකරණ යන්ත්‍ර අළුත්වැඩියා කිරීම (අංක 01 දරන කාමරය) |
| 9 | අස්ගිරිය | ඉදිකිරීම් කටයුතු පිළිබඳ පැවැත්වෙන රැස්වීමට සහභාගිවීම (වාහල්කඩ ඉදි කිරීම) |
| 11 | අනුරාධපුර | පාර්ලිමේන්තු නිවාඩු නිකේතනය භූමියේ භූ දර්ශන කටයුතු<br>1. තණපිඩලි ඇල්ලීම<br>2. මල් පැල සිටුවීම<br>3. ගස් සිටුවීම - පාම් ගස් , පළතුරු ගස් |
| 12 | දඹුල්ල | i.පූජා නගරයේ හරිත තීරුව වැඩිදියුණු කිරීමට අවශ්‍ය මූලික වැඩ කරවීම ( තණ කොළ කැපීම , අප ද්‍රව්‍ය ඉවත් කිරීම) |

| | | |
|---|---|---|
| | | ii.ඉදිරි වැඩ කටයුතු පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම. |
| 13 | අස්ගිරිය | යෝජිත වාහල්කඩ ඉදිකිරීම් පිළිබඳ සාකච්ඡා කිරීම.<br>වාහල්කඩ - විජේසුන්දරාරාමය සඳහා ව්‍යුහ සැලසුම් කිරීම<br>වාහල්කඩ - මීරක්කම් පල්ලිය අසල |
| 14 | ශ්‍රී පාදස්ථානය | හැටන් මාර්ගයේ (වන්දනා කරුවන් භාවිතා කරන) පහන් කණු 266 සිට 277 දක්වා කොටසේ පඩිපෙල පිලිසකර කිරීම පිළිබද සොයා බලා වාර්තා කිරීම. |
| 15 | දියවන්නා නිල නිවාස | ගොඩනැගිල්ලේ අළුත් වැඩියා නඩත්තු කටයුතු සඳහා පරීක්ෂණ වාර්තා පිලියෙල කිරීම සඳහා පරීක්ෂා කිරීම. |
| 16 | අළුත් නුවර | 1. අළුත් නුවර දේවාලයේ පංසල් භූමියෙහි ඉදිකිරීමට යෝජිත ගොඩනැගිලි සඳහා පස පරීක්ෂා කිරීම සහ මැනුම් කටයුතු<br>1.1.දාන ශාලාව<br>1.2.නාන ශාලාව<br>2. ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල යෝජිත ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා භූමිය සහ පස පරීක්ෂා කිරීම සහ ව්‍යුහ නිර්මිතයන් සඳහා සැලසුම් සකස් කිරීම |
| 17 | මැද මුලන | 1.පල්ලි මුලන පූජා භූමිය<br>2.ආවාස ගෙය බුදු මැදුර සහ පුස්ථකාලය ඉදිකිරීම කටයුතු පිලිබඳ උපදෙස් ලබා දීම සහ ව්‍යුහ සැලසුම් පිළියෙල කිරීම |
| 18 | හක්මන | කැබිලියපොල රජමහ විහාරය ඉදිකිරීම පිළිබඳ පරීක්ෂා කිරීම සහ යෝජිත ඉදිකිරීම සඳහා සුදුසු ස්ථාන පිලිබඳ සාකච්ඡා කිරීම, පුස්ථකාල ගොඩනැගිල්ල, ධර්ම ශාලා ගොඩනැගිල්ල, පිලිම ගෙය භාවනා කුටි සීමා මාලකය නවාතැන් ගොඩනැගිල්ල සංඝාවාස වැඩි දියුණු කිරීම, වාහල්කඩ, ආවාස ගෙය ස්තූප මළුව |
| 19 | මුල්කිරිගල පුරාණ විහාර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය | නව දෙමහල් සංඝාවාස ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා යෝජිත භූමිය පරීක්ෂා කිරීම සහ ව්‍යුහ සැලසුම් පිළියෙල කිරීම හා ව්‍යුහ නිර්මිත සැලසුම් පිළියෙල කිරීම |
| 20 | උමංගල ඕවාගිරි රජමහ විහාර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය | ධර්ම ශාලා ගොඩනැගිල්ල, විශ්‍රාම ශාලා ගොඩනැගිල්ල වාහල්කඩ ඉදිකිරීම් සඳහා භූමිය පරීක්ෂා කිරීම. |
| 21 | තිස්සමහාරාම රජමහා විහාර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය | යෝජිත ඉදිකිරීම් සඳහා සුදුසු ස්ථාන පරීක්ෂා කිරීම සහ තීරණය සංඝාවාසය ගොඩනැගිල්ල නර්තන ශිල්පීන් මාධ්‍යකරුවන් සහ පොලිස් නිලධාරින් යෝජිත ගොඩනැගිල්ල, කෞතුකාගාර, වැනි පුහුණු මධ්‍යස්ථාන ධර්මශාලා හා ගොඩනැගිලි සඳහා ව්‍යුහ සැලසුම් පිළියෙල කිරීම |

| | | |
|---|---|---|
| 22 | අස්ගිරිය විහාරස්ථානය | ප්‍රධාන ප්‍රවේශ මාර්ගයෙහි නාමපුවරුව ඉදිකිරීම හා ඊට අදාළ අත්තිවාරම සැලසුම් කිරීම, ප්‍රවේශ මාර්ගයට අදාළ රැඳවුම් බැමි ව්‍යුහ නිර්මාණ සැලසුම් කිරීම |
| 23 | වැල්ලපාගොඩ ශ්‍රී කතරගම දේවාල සංවර්ධන ව්‍යාපෘතිය | යෝජිත වලාකුළු බැම්ම ඉදි කිරීම සඳහා භූමිය පරීක්ෂා කිරීම. |
| 24 | දිඹුලාගල | (1) යෝජිත නව පිරිවෙන් ගොඩනැගිල්ල ඉදි කිරීම සඳහා ක්ෂේත්‍ර පරීක්ෂාව<br>(2) අළුත්වැඩියා කිරීම් සඳහා ගොඩනැගිලි පරීක්ෂා කිරීම.<br>1.පැරණි පිරිවෙන් ගොඩනැගිල්ල<br>2.පැරණි දාන ශාලා ගොඩනැගිල්ල<br>3.පැරණි සංඝාවාසා ගොඩනැගිල්ල<br>(3) ආපන ශාලා ගොඩනැගිල්ලෙහි ඉහල මාලය ඉදිකිරීමට අවශ්‍ය මිණුම් ගැනීම. |
| 25 | ඉඩම් සමීක්ෂණ වාර්ථා | i. හැපිනාකන්ද කුඩු මිරිස්ස ජනපදයට යාමට ඇති මාර්ගය පුළුල් කිරීම සඳහා ඉඩම් සමීක්ෂණ වාර්ථාව<br>ii.කොස්කඳවල වසමේ කිරිදිවෙල ප්‍රධාන මාර්ගයට නුදුරින් පිහිටි අතුරු මාර්ගය අත්පත් කර ගැනීමේ සමීක්ෂණය<br>iii.සේරු දණ්ඩාපොල කසළ බැහැරලන ඉඩම පවරාදීම සඳහා<br>iv.අළුත්නුවර දේවාලයට පිවිසෙන පඩිපෙළ සහිත මාර්ගය සංවර්ධනය කිරීමට ක්ෂේත්‍ර පරීක්ෂාව |

### 5.5 ප්‍රමාණ සමීක්ෂණ අංශය මගින් සිදුකරන ලද කාර්යයන්

01. රත්නපුර සමන් දේවාලය සංවර්ධන කටයුතු ඇස්තමේන්තුවක් සකස් කිරීම
02. ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ පාලන අංශයෙහි අධ්‍යක්ෂවරුන් සඳහා කාමර වෙන් කිරීම.
03. දඹුල්ල පූජා භූමි හරිත තීරුව භූ දර්ශන කටයුතු සඳහා ඇස්තමේන්තු පිළියෙල කිරීම
04. පොතුවිල් මුහුදු මහා විහාරය සංඝාවාසය හා පුස්ථකාල ගොඩනැගිල්ල
05. සංචාරක නිවාසය ( පාර්ලිමේන්තු) භූ දර්ශන කටයුතු.
06. මැදමූලන පල්ලෙමූලන විහාරය බුදු මැදුර , ආවාසගෙය , පුස්ථකාල ගොඩනැගිල්ල
07. පොල්මුබේ නගර සංවර්ධන යෝජනා ක්‍රමය ඉදිකිරීම් කටයුතු.
08. පුස්සැල්ල නගර සංවර්ධන යෝජනා ක්‍රමය ඉදිකිරීම් කටයුතු.
09. රත්නපුර සමන් දේවාලය රථගාල සහ කඩ සාප්පු
10. අස්ගිරිය නිල ආරාමය රියදුරු නේවාසිකාගාරය සහ ආරක්ෂක කාමරය
11. අස්ගිරිය සුමංගල මාවත වාහල්කඩ

12. ලෝක නගර දිනය ප්‍රදර්ශන නාම පුවරු
13. අනුරාධපුර මහමෙවුනා උයනේ ලාම්පු කණු හා ලාම්පු අළුත්වැඩියා කිරීම හා තීන්ත ආලේප කිරීම.
14. හක්මන කැබලියපොල විහාරයේ භාවනා කුටි.
15. දැයට කිරුල 2014 භූ දර්ශන කටයුතු.
16. දිඹුලාගල රජමහ විහාරය පිරිවෙන් ගොඩනැගිල්ල සහ සංඝාවාස ගොඩනැගිල්ල.
17. කැළණිය වැඩබිම් කාර්යාලය දොර අළුත් වැඩියා කටයුතු.
18. දියවන්නා නිල නිවාස ගොඩනැගිල්ල අළුත්වැඩියා කටයුතු හා තීන්ත ආලේප කිරීම.
19. ගෝනපොල වැල්පාගොඩ ශ්‍රී කතරගම දේවාලය වලාකුළු බැම්ම.
20. මා කඩුව මධ්‍ය මහා විද්‍යාලය භූ දර්ශන කටයුතු.

## 06 .වාස්තු විද්‍යා අංශය

වාස්තු විද්‍යා අංශය අධ්‍යක්ෂ වාස්තු විද්‍යා යටතේ පවතී. මෙම අංශය සැලසුම් කාර්යාල සහකාරවරුන්, සැලසුම් ශිල්පීන් 21 දෙනෙකුගෙන් සමන්විත වේ. එක් සැලසුම් කාර්යාල සහකාරවරයකු හා සැලසුම් ශිල්පීන් කිහිප දෙනෙකු අවශ්‍යතාවය අනුව අධ්‍යක්ෂ (ඉංජිනේරු) යටතේ ඇස්තමේන්තු සකස් කිරීම සඳහා ඉංජිනේරු අංශයට අනුයුක්තව කටයුතු කරනු ලැබේ.

ගෘහ නිර්මාණ ශිල්පීන්, ඉංජිනේරුවරුන් නගර නිර්මාණකරුවන් විසින් සකස් කරන ලද සැලසුම් අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා) මගින් සැලසුම් සහකාරවරුන්ට ලැබී වාස්තු විද්‍යා සැලසුම්, ඉංජිනේරු සැලසුම් හා වින්‍යාස සැලසුම් සකස් කිරීම සිදු කෙරේ.

මෙම සකස් කරන සැලසුම් ගබඩා කිරීම, පිටපත් කිරීම හා විනාශ නොවී පවත්වාගෙන යාම සඳහා සැලසුම් භාරකරුවකු, සැලසුම් මුද්‍රණ ශිල්පීන් දෙදෙනෙකු හා සැලසුම් අළුත්වැඩියා කරන්නකු මෙම අංශය යටතේ තවදුරටත් සේවයේ නියුක්ත වේ.

### 6.1 2013 වසරේදී නිම කරන ලද වින්‍යාස සැලසුම්

| අනු අංකය | පූජා භූමිය | ව්‍යාපෘතිය /සැලසුම් විස්තරය |
|---|---|---|
| A/AR/248/13 | අස්ගිරිය මහා විහාරය | වාහල්කඩ සැලැස්ම |
| A/AR/249/13 | අස්ගිරිය මහා විහාරය | යෝජිත ගරාජය , රියදුරන්ගේ කාමරය , සැලසුම් කාමරය |
| A/AR/252/13 | අස්ගිරිය නීල ආරාමය | |
| A/AR/253/13 | අස්ගිරිය නීල ආරාමය | විදුලි සැපයුම් සැලැස්ම |
| A/AR/254/13 | අළුත් නුවර | නැනසල හා ගබඩාව සඳහා ගොඩනැගිලි සැලසුම් |
| A/AR/255/13 | අනුරාධපුර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය | යෝජිත සීමා දොරටුව සැලැස්ම |
| A/AR/256/13 | අනුරාධපුර පූජා භූමි සැලසුම් යෝජනා ක්‍රමය | යෝජිත රථ ගාල සැලැස්ම |
| B/AR/73/13 | බොල්තුඹේ සමන් දේවාලය | යෝජිත වාහල්කඩ සැලැස්ම |
| B/AR/74/13 | බොල්තුඹේ සමන් දේවාලය | යෝජිත විශ්‍රාම සැලැස්ම |
| B/AR/75/13 | බොල්තුඹේ සමන් දේවාලය | සංවර්ධන සැලැස්ම |
| B/AR/76/13 | බොල්තුඹේ සමන් දේවාලය | යෝජිත සංඝාවාසය සඳහා සැලැස්ම |
| B/AR/77/13 | බොල්තුඹේ සමන් දේවාලය | යෝජිත නැටුම් ශාලාව සඳහා සැලැස්ම |

| | | |
|---|---|---|
| B/AR/78/13 | බොල්තුඹේ සමන් දේවාලය | යෝජිත වැසිකිලි පද්ධතිය සඳහා සැලැස්ම |
| B/AR/79/13 | බොල්තුඹේ සමන් දේවාලය | යෝජිත පොලීසි ආරක්ෂක ගොඩනැගිල්ල |
| D/PL/36/13 | දඹුල්ල කොරියන් කොරිඩොව | සංවර්ධන සැලැස්ම |
| D/AR/41/13 | දොඩම්වල ශ්‍රී නාථ දේවාලය | යෝජිත ගම්මඩුව සඳහා සැලැස්ම |
| G/ST/34/13 | ගොඩකවෙල පුහුණු මධ්‍යස්ථානය | අත්තිවාරම සඳහා සැලැස්ම |
| G/ST/35/13 | | මහල සැලැස්ම |
| G/ST/36/13 | | |
| G/ST/37/13 | | |
| G/ST/38/13 | ගොන්බද්දල | දාන ශාලාව සැලැස්ම |
| G/AR/39/13 | ගොඩකවෙල රාහුල මධ්‍ය මහා විද්‍යාලය | භූ දර්ශන සැලැස්ම |
| K//AR/273/13 | කරන්දෙනිය | දොර ජනෙල් පිලිබඳ වැඩිදුර තොරතුරු සැපයීම |
| K/AR/275/13 | කැබලියපොල රජමහ විහාරය | බුදු කුටිය සැලැසුම් කිරීම |
| K/AR/276/13 | | ධාතු මන්දිරය |
| K/AR/277/13 | කැබලියපොල රජමහ විහාරය | පුන්කලස |
| K/AR/278/13 | කඩුවෙල | වානිජ සහ ගෘහස්ථ ගොඩනැගිලි සඳහා සැලසුම් |
| K/AR/279/13 | කඩුවෙල | |
| K/AR/280/13 | කුරුවිට | යෝජිත ගොඩනැගිලි සඳහා සැලසුම් |
| K/AR/281/13 | | |
| K/AR/282/13 | | |
| K/AR/283/13 | | |
| K/AR/284/13 | | |
| K/AR/285/13 | කතරගම | යෝජිත දාන ශාලාව |
| K/AR/287/13 | කුරුවිට | යෝජිත පොදු වෙළඳ පොල |
| M/AR/257/13 | මුල්කිරිගල | යෝජිත සංඝාවාසය |
| M/AR/258/13 | මොරුතොට | යෝජිත බහුකාර්ය ගොඩනැගිල්ල |
| M/AR/259/13 | මැදමූලන | යෝජිත පුස්ථකාලය සහ බුදු මැදුර |
| M/AR/260/13 | මැදමූලන | යෝජිත ආවාසගෙය දොර ජනෙල් තොරතුරු |

| | | |
|---|---|---|
| M/AR/261/13 | මැද මූලන | දොර ජනෙල් තොරතුරු |
| M/AR/262/13 | මුලකිරිගල | සංවර්ධන සැලැස්ම |
| M/AR/263/13 | | |
| M/AR/264/13 | මැදගොඩ | යෝජිත සංඝාවාසය ,දාන ශාලාව |
| M/AR/265/13 | මැද මුලන | සංඝාවාසය |
| M/AR/266/13 | මුල්කිරිගල | විදුලි සැලැස්ම (සංඝාවාසය සඳහා) |
| M/AR/267/13 | | |
| M/ST/268/13 | මාකදුර මහා විද්‍යාලය | රැඳවුම් බැම්ම |
| M/ST/269/13 | මාකදුර සංවර්ධන සැලැස්ම | ජලය බැස යන කාණු පිළිබඳ තොරතුරු |
| P/AR/118/13 | පුස්සැල්ලාව | තේ හල |
| P/AR/119/13 | පුස්සැල්ලාව | විශ්‍රාම ශාලාව |
| P/AR/120/13 | පුස්සැල්ලාව | පිවිසුම් දොරටුවේ සැලැස්ම |
| P/PL/121/13 | පුස්සැල්ලාව | සංවර්ධන සැලැස්ම |
| P/PL/122/13 | | |
| P/PL/123/13 | | |
| P/ST/124/13 | මිහිඳු මහා විහාරය - පොතුවිල් | ව්‍යුහගත තොරතුරු |
| P/AR/125/13 | පස්ගම | වැසිකිලි පද්ධතිය |
| P/AR/126/13 | ශ්‍රී නාථ දේවාලය | වලාකුළු බැම්ම සහ පළතුරු වට්ටි සැකසීමේ ස්ථානය |
| P/AR/127/13 | | |
| P/AR/128/13 | පුස්සැල්ලාව | පාසලේ පිවිසුම් දොරටුව සංවර්ධන සැලැස්ම |
| P/AR/129/13 | ශ්‍රී නාථ දේවාලය- පස්ගම | සංවර්ධන සැලැස්ම |
| R/AR/28/13 | රත්මලාන ජල සම්පත් මණ්ඩලය | යෝජිත කම්කරු නිල නිවාසය |
| R/AR/29/13 | රත්මලාන ජල සම්පත් මණ්ඩලය | යෝජිත නිල නිවාසය |
| R/AR/30/13 | රත්මලාන ජල සම්පත් මණ්ඩලය | යෝජිත වැඩබිම |
| S/AR/53/13 | සේරුවිල පූජා භූමිය | ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ සංචාරක බංගලාවේ අළුත් වැඩියා කටයුතු සහ සැලැස්ම |

| | | |
|---|---|---|
| T/AR/47/13<br>T/AR/48/13<br>T/AR/49/13<br>T/AR/50/13 | තිස්සමහාරාමය | පොලිස් මුරපොල , ජන මාධ්‍ය කරුවන් ,නැටුම් කණ්ඩායම්, වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ,කෞතුකාගාරය සහ සංඝාවාසය සඳහා සැලසුම් |
| W/AR/51/13 | වනාතවිල්ලු | සංවර්ධන සැලැස්ම යෝජිත විවේකී උද්‍යානය |

# 7. ගිණුම් අංශයේ කාර්යසාධනය

## 7.1 ගිණුම් අංශයේ අරමුණු

වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් දෙපාර්තමේන්තුව වෙත වෙන් කරනු ලබන ප්‍රතිපාදන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ,මුල්‍ය රෙගුලාසි ආයතන සංග්‍රහය අනෙකුත් චක්‍රලේඛ නීතිරීති වලට පටහැනි නොවන සේ ඵලදායීව හා කාර්යක්ෂමව මුල්‍ය කළමනාකරණය සිදු කිරීම.

## 7.2 සේවාවන්

1. දෙපාර්තමේන්තුවේ හා ව්‍යාපෘතිවල සේවයේ නියුතු කාර්ය මණ්ඩලයට වැටුප් හා වේතන, අනෙකුත් අදාල වියදම් ගෙවීම.
2. සිදු කරනු ලබන මූල්‍යමය ගණුදෙනු වලට අදාල මාසික ගිණුම් සාරාංශ සකස් කිරීම හා මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.
3. වාර්ෂික ගිණුම් පිලියෙල කිරීම හා ඉදිරිපත් කිරීම.
4. දෙපාර්තමේන්තුවට හා ඒ යටතේ ඇති ආයතන වලට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම හා ගබඩා කටයුතු පවත්වාගෙන යාම.
5. වත්කම් කළමනාකරණය.
6. විගණකාධිපති වෙත විගණනය සඳහා ලිපි ලේඛන ඉදිරිපත් කිරීම හා විගණන විමසුම් වලට පිළිතුරු ඉදිරිපත් කිරීම.
7. අත්තිකාරම් බී ගිණුම යටතේ ණය ගෙවීම හා අයකර ගැනීම.

1. පුද්ගලික පඩිනඩි හා සම්බන්ධ ප්‍රතිපාදන මත දරණ ලද වියදම - 2013

| | 2013 ඇස්තමේන්තු (රු) | මු.රෙ.66/69 මාරු කිරීම් (රු) | පරිපූරක ඇස්තමේන්තු (රු) | මුළු ප්‍රතිපාදන (රු) | මුළු වියදම (රු) |
|---|---|---|---|---|---|
| පුද්ගලික පඩිනඩි | 101,100,000 | (2,500,000)<br>2,500,000 | - | 101,100,000 | 97,920,892 |

## 2.අනෙකුත් පුනරාවර්තන වියදම් හා සම්බන්ධ ප්‍රතිපාදන මත දරන ලද වියදම - 2013

| | 2013 ඇස්තමේන්තු (රු) | මු.රෙ.66/69 මාරු කිරීම් (රු) | පරිපූරක ඇස්තමේන්තු (රු) | මුළු ප්‍රතිපාදන (රු) | මුළු වියදම (රු) |
|---|---|---|---|---|---|
| අනෙකුත් පුනරාවර්තන වියදම් | 44,035,000 | (290,000)<br>290,000 | - | 44,035,000 | 42,589,193 |

## 3 . 2013 වර්ෂයේ ආදායම් වාර්තාව

| විස්තරය | මූලික ඇස්තමේන්තුව (රු.මි) | සංශෝධිත ඇස්තමේන්තුව (රු.මි) | ආදායම 2015 (රු.මි) |
|---|---|---|---|
| 2002-10-01 | 1.5 | 1.4 | 1.9 |
| 2002-20-02 | 1.5 | 1.5 | 1.3 |
| 2003-99-00 | 1.0 | 0.2 | 0.7 |

## 4 . එක් එක් ප්‍රාග්ධන වැය විෂයන් හා සම්බන්ධ ප්‍රතිපාදන මත දරන ලද වියදම - 2013

| වැය ශීර්ෂය | 2015 ඇස්තමේන්තු | මු.රෙ. 66/69 මාරු කිරීම් හා පරිපූරක ඇස්තමේන්තු (රු) | මුළු ප්‍රතිපාදන (රු) | මුළු වියදම(රු) |
|---|---|---|---|---|
| 311-1-1-0-2001 | 150,000 | - | 150,000 | 143,572 |
| 311-1-1-0-2002 | 150,000 | - | 150,000 | 72,465 |
| 311-1-1-0-2003 | 700,000 | - | 700,000 | 693,400 |
| 311-1-1-0-2102 | 60,000 | - | 60,000 | 59,268 |
| 311-1-1-0-2104 | 60,000 | 8,459,724 | 8,519,724 | 8,519,724 |
| 311-1-1-0-2401 | 150,000 | - | 150,000 | 146,381 |
| 311-1-1-0-2502 | - | 2,100,000 | 2,100,000 | 2,100,000 |

## 5 . රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුමේ සීමාවන් හා සත්‍ය අගයන් - 2013

විෂය අංකය - 311011

| | සීමාව | සත්‍ය අගය |
|---|---|---|
| උපරිම හර සීමාව | 14,000,000 | 5,772,892 |
| අවම බැර සීමාව | 7,400,000 | 12,367,902 |
| උපරිම හර ශේෂ සීමාව | 90,000,000 | 30,270,981 |

**මූලාශ්‍රය - දෙපාර්තමේන්තු මූලාශ්‍ර**